# මමත් තාත්තා වගේ... හොඳට හොඳයි නරකට නරකයි..

*හිරුණිකා එරංපිලී ප්‍රේමචන්ද්‍ර*

*හිරුණිකා එරංපිලී ප්‍රේමචන්ද්‍ර කියන්නේ අපේ රටේ දේශපාලනයට එක්වෙච්ච අලුත්ම චරිතයක්. ඇයගේ මේ දේශපාලන ආගමනය සිදුවෙන්නේ සිය පියා, භාරත ලක්ෂ්මන් ප්‍රේමචන්ද්‍ර ඝාතනයවීමෙන් පසුව. පියාගේ අවමංගල උත්සවයේදී ඇය කළ කතාවෙන් මුල්වරට ජනමාධ්‍යයට පුවත් මවන්නියක බවට පත්වුණු ඈ ඉන් පසුව වරින්වර දිගින් දිගටම මේ පුවත් මැවීමේ කටයුත්තට දායක වුණා. මාර්තු මාසේ අවසාන සතියේ නැවතත් හිරුණිකා ජනමාධ්‍යයේ මුල් පුවත් අතරට එක්වුණේ පුද්ගලයකුට පහරදීමේ චෝදනාවකට ලක්ව අධිකරණයෙන් රුපියල් ලක්ෂ දහයක ශරීර ඇප මත නිදහස ලැබීමේ සිදුවීමෙන්. 'සන්නස' ඇය හා මේ කතාබහට එක්වන්නේ ඒ සිදුවීමෙන් පසුවයි.*

**ඔබ මෑත කාලයේ ජනමාධ්‍යයට පුවත් මවන චරිතයක්. මාස දෙක තුනකට සැරයක් හිරුණිකා මුල් කරගත්ත ප්‍රමුඛ පුවතක් අහන්නට දකින්නට ලැබෙනවා. ඔබ ගැන අලුතෙන්ම අහන්න ලැබුණ පුවත නම් සුබදායක එකක් නොවෙයි. ඔබ පුද්ගලයකුට පහරදීමක් සම්බන්ධයෙන් චූදිතයකු බවට පත්වුණා විතරක් නෙවෙයි අධිකරණයේ අවවාද කිරීම්වලට ලක්වුණා. මොනවද මේ සිදුවෙමින් තියෙන්නේ?**

ඒක සම්පූර්ණයෙන්ම අසත්‍ය චෝදනාවක්. මගේ තාත්තට අයිති එකම දේපොළ බොරැල්ලේ කිංසි පාරේ තියන ගොඩනැගිල්ල එහා පැත්තේ ඉන්න පුද්ගලයෙක් තාත්ති නැතිවුණාට පස්සේ අපිට දිගින් දිගටම කරදර කරනවා. එතන ඉස්සරහා මල් පදුරක් වැව්වත් ඒ මනුස්සයා ඒවා ගලවලා දානවා. පහුගිය දවසක මල්පැල වගයක් ගලවලා දාලා තිබුණාට පස්සේ මම ගියා ඒ මොකද අපිට මේ විදිහට කරදර කරන්නේ කියලා අහන්න. මම වාහනේ ඉඳගෙන මේ මනුස්සයාට පණිවිඩයක් යැව්වා එන්න කියලා. ඒ මනුස්සයා කියලා එවලා තිබුණා එයාට එන්න බෑ. ඕනේ නම් මට එයා ළඟට එන්න කියලා. ඊට පස්සේ මම වාහනෙන් බැහැලා ඒ මනුස්ස- යාගේ ගොඩනැගිල්ල ඇතුළට ගියා මේ ගැන කතාකරන්න. එතනදි අපි අතරේ බහින්බස්වීමක් සිදුවුණා. ඒ මනුස්සයා මට අත පය දික්කරගෙන ආවා. නමුත් අපි ගහගන්න ගියේ නෑ. අපි ආපහු ආවට පස්සේ ගිහිල්ලා පොලිසියට බොරු පැමිණිල්ලක් දාලා අපි ගැහුවා කියලා. ඕක තමයි ඇත්ත සිද්ධිය.

**ඔබ ආරක්ෂකයන් සමඟ අනවසරයෙන් ගොඩනැගිල්ලකට ඇතුළු වෙන ආකාරය විද්‍යුත් මාධ්‍ය මගින් ප්‍රචාරය වුණානේ?**

ඔව්. ගොඩනැගිල්ලට ඇතුළුවෙන එකයි, පිටවෙන එකයිනේ පෙන්නුවේ. සීසීටීවී කැමරා තිබ්ලත් එහෙම නම් නඩුදාපු විදිහට මම ඒ මනුස්සයට ගහන එකත් පෙන්නන්න එපායැ. දැන් ඕක දිගින් දිගටම දැම්මේ මගේ තාත්තගේ මිනීමරුවන්ගේ චැනල් එකේනේ. මට ටීවී චැනල් නෑ ඇත්ත මොකක්ද කියලා කියන්න.

**එතකොට මහේස්ත්‍රාත්ගේ අවවාද කිරීම්වලට ලක්වුණේ?**

ඔය මනුස්සයාගේ පැමිණිල්ල උඩ පොලිසියෙන් මට විරුද්ධව නඩුවක් දාලා තියනවා. එදා මම ඒ නඩුවට යන කොට ඇඳගෙන ගියේ අත් දිග ලා රෝසපාට වගේ ටොප් එකකුයි දිග කලිසමයි. තාත්තගේ නඩුව පටන්ගත්ත දා ඉඳලා මේ වෙනකම් සති දෙකෙන් දෙකට මම උසාවි යනවා. ඒ යනකොටත් ඇඳගෙන යන්නේ දිග කලිසමක්. ටොප් එකත් හොඳට කර පියවෙච්ච අත් දිග එකක්. ඇත්තටම මම දන්නේ නෑ මම ඇඳගෙන ගිය ඇඳුම උසාවියට යන්න ගැලපෙන්නේ නැති හේතුව මොකක්ද කියලා. කෙනෙකුට තියන ඇඳුමක් නේ ඇඳගෙන යන්නේ. මොන හේතුවක් නිසා ගැලපෙන ඇඳුමක් ඇඳගෙන එන්න කියලා කිව්වද මම දන්නේ නෑ. හැබැයි මාධ්‍යවල ගිය විදිහට ඒක කිව්වේ මහේස්ත්‍රාත්තුමිය නෙවෙයි. තෝල්ක මුදලියි කිව්වේ. මහේස්ත්‍රාත්තුමිය වචනයක්වත් කිව්වේ නෑ. නරක කාලයක් ආවම හැමදේම අනෙක් පැත්තට කැරකෙනවා කියනවානේ. මම හිතන්නේ ඒක වෙන්න ඇති මේ අපිටත් වෙන්නේ.



**ඔබ මුලින්ම ජනතාව ඉදිරියේ පෙනී සිටින්නේ පියාගේ මරණය වෙනුවෙන් යුක්තිය සහ සාධාරණය ඉල්ලා සිටින දියණියක් විදිහට. මේ වෙන- කොට ඔබ එදා ඉල්ලූ ඒ යුක්තිය ඉටුවී තිබෙනවද?**

තාත්ත ඝාතනය වුණ දා ඉඳලා අද වෙනකම්ම අපිට සිදුවුණේ අසාධාරණකම්. යම් සාධාරණයක් වුණා නම් වුණේ අධිකරණයේදී විතරයි. මේකෙදි නීතිය නිසි විදිහට ඉෂ්ඨ වෙන්න නොදී යම් බලවත් පුද්ගලයෙක් ඊට අත පොවනවා. හොඳම උදාහරණය නඩුව පටන්ගත්ත දා ඉඳලා අද වෙනතුරු අපි හැම නඩු වාරයකදිම උසාවියට යනවා. ඒත් නඩුවට සම්බන්ධ ප්‍රධාන පුද්ගලයා එකම දවසක්වත් උසාවියට ඇවිල්ලා නෑ. ඔහුගේ නීතිඥා උසාවියට ඇවිල්ලා යම් යම් දේ කියනවා. නමුත් මේ කියන දේවල් ඇත්තද කියලා අපි කවුරුවත් දන්නේ නෑ. මාධ්‍යයට විවිධ පින්තූර පෙන්- වනවා. කවුද දන්නේ මේවා ඇත්ත පින්තූරද බොරු ඒවාද කියලා. අඩුතරමේ හොස්පිටල් එකට ගිය මහේස්ත්‍රාත්තුමාටවත් බැරි වුණානේ මේ පුද්ගලයත් එක්ක කතා කරන්න. මහේස්ත්‍රාත්තුමා යන වෙලාවේ මේ පුද්ගලයා නිදාගෙන ඉඳලා තියනවා කියලනේ කියන්නේ. ඔහුගේ තාත්ත කිව්වලු නැගිටිනකම් ඉන්නේ නැතිව එක සරේම කතා කළොත් ෂොක් වෙනවා කියලා. ඉතිං මහේස්ත්‍රාත්තුමාට සිද්ධවෙලා තියෙන්නේ නිදාගන හිටපු මිනිහට බලලා එන්න. මොන දේ කිව්වත් මම පැහැදිලිවම දන්නවා දුමින්ද සිල්වා සාමාන්‍ය තත්ත්වයක ඉන්නවා කියලා. මානසික මට්ටම මොකක්ද කියන්න අපි දන්නේ නෑ. නමුත් කායිකව හොඳ සෞඛ්‍ය තත්ත්වයකින් ඉන්නවා. මම කරුණු හොයලා බලලා වගකීමකින් මේ කියන්නේ. නමුත් අඩුම තරමින් ඔහු උසාවියටවත් එන්නේ නෑ. අපි තවමත් සති දෙකෙන් දෙකට උසාවි යනවා. ඕක තමයි මේ වෙනකොටත් ඉෂ්ඨ වෙලා තියන යුක්තියේ තරම.

**ඔබ කියන්නේ අධිකරණයට වාර්තා වෙන දේවල් සහ ඇත්ත තත්ත්වය අතර ලොකු වෙනසක් තියනවා කියලා. එහෙම නම් ඇත්ත තත්ත්වය අධිකරණය ඉදිරියට ගෙනයාමට ඔබ ක්‍රියා කළ යුතුයි නේද?**

දැන් මේ නඩුව ගෙනියන්නේ සී අයි ඩී එකෙන්නේ. ඒ නිසා අධිකරණයට කරුණු වාර්තා කිරීම කරන්න ඕනේ ඒ අය.නමුත් සී අයි ඩී එකට ස්වාධීනව මේ වැඩේ කරගන යන්න පුළුවන්කමක් නෑ. ලොකු බලපෑමක් තියනවා. මට පෞද්ගලිකව අධිකරණයට කරුණු ඉදිරිපත් කරන්න පුළුවන් කමක් නෑ. නමුත් මගේ තාත්තගේ ඝාතකයා ගැන මම නිතරම සෙවිල්ලෙන් ඉන්නේ. ඔහුගේ තත්ත්වය මොකක්ද කියන එක මට දැනගන්න ලැබෙනවා. ඒක දන්න තවත් අය ඉන්නවා. නමුත් අධිකරණය ඉදිරියට ඒක යන්නේ නෑ. එහෙම තියනකොට මම මොකද කරන්නේ.

**ඔබේ පියා දීර්ඝ කාලයක් තිස්සේ වත්මන් ජනාධිපතිවරයා සමඟ ඉතා සමීපව කටයුතු කළ කෙනෙක්. ඝාතනයට ලක්වන අවස්ථාව වන විටත් ඔහු ජනාධිපතිවරයාගේ උපදේශකවරයෙක්. මේ සිදුවෙමින් පවතින වැරැද්ද ගැන ඔබ ජනාධිපතිවරයාට කියා සිටියේ නැත්ද?**

ඇත්ත. ඔබ කියන විදිහේ සමීප සම්බන්ධතාවයක් තිබුණා තමයි. මම පොඩි කාලේ ඉඳලා හැදුණේ වැඩුණේ ජනාධිපතිවරයාගේ ගෙදර. පුතුන් තුන්දෙනෙක් හිටපු ජනාධිපතිවරයාගේ පවුලේ එකම දියණිය මම. ජනාධිපතිවරයාගේ පුතාලා තුන්දෙනා මට සහෝදරයන් තුන්දෙනෙක් වගේ. ජනාධිපති ආර්යාව මට දෙවනි අම්මා වගේ. ජනාධිපතිතුමා මගේ දෙවනි තාත්තා වගේ. ඒ කාලේ මගේ

සටහන හා ඡායාරූප
ශ්‍රීලාල් සෙනෙවිරත්න

ගෙදර තාත්ති එක්ක රණ්ඩුවක් වුණත් මම ජනාධිපතිවරයාට තමයි කෝල් කරලා කියන්නේ. එහෙම තමයි තිබුණේ. නමුත් මගේ තාත්තගේ අවමංගල්‍ය උත්සවයේදී මම කරපු කතාවෙන් පස්සේ ජනාධිපතිවරයා මට දුරකථනයෙන් කතාකරලා දොස් කිව්වා. මට දැනගන්න ලැබුණා කීපදෙනෙක් එක්ක කියලා තියනවා කියලා මම කියන දේ නාහන හිතුවක්කාර ළමයෙක් කියලා. ඒ නිසා මට හිතුණා මේ ගැන කතාකරන්න ගිහිල්ලා අපි අතර ඉතුරුවෙලා තියන සම්බන්ධතාවත් නැති වෙන්න පුළුවන් කියලා. ඒ නිසා මම කිසිම වෙලාවක මේ ගැන ජනාධිපතිවරයා සමඟ කතා කරන්න ගියේ නෑ.

**'ලකී මල්ලිව' මහ පාරේ මරාදාපු එක ගැන 'මහින්ද අයියා'ට වගක් නෑ වගේද?'**

ජනාධිපතිතුමාට හිටිය එකම මල්ලි 'ලකී මල්ලි' වුණ කාලයක් තිබුණා. විශේෂයෙන්ම ඒ එතුමා ජනාධිපති වෙන්න කලින්. ඒ කාලේ 'මහින්ද අයියගේ' හැම ප්‍රශ්ණයකදිම ඉස්සරහින්ම හිටියේ 'ලකී මල්ලි'. එතුමට විපක්ෂ නායකකම දෙන්න කියලා මුලින්ම කිව්වේ තාත්ති. අගමැතිකම ලක්ෂ්මන් කදිරගාමර්ට දෙන්න යන බව දැනගත්ත වෙලාවේ තාත්ති 'එහෙම කොහොමද මහින්ද අයියේ, යමු බලන්ඩ' කියලා ෂර්ට් එකක් දාගෙන ගිය හැටි මට තවම මතකයි. අපි එතුමා ජනාධිපති වෙනකම් දැනගෙන හිටියේ නෑ එතුමට මේ තරම් මල්ලිලා පිරිසක් ඉන්නවා කියලා. දේශපාලකයෙක් විදිහට මැරුණ මිනිහට වැඩිය වැඩක් ගන්න පුළුවන් ජීවත්වෙන මිනිහාගෙන් කියලා එතුමා හිතනවද දන්නේ නෑ. දැන් ජනාධිපතිතුමා මේක නීතියටම බාරදීලා තියෙන්නේ. මේකට එතුමා මැදිහත්වෙන්නේ නෑ. වෙනත් පුද්ගලයෙක් මැදිහත්වෙන්නේ. දේශපාලකයෙක් විදිහට නැතුව ඉස්සර තාත්තිට හිටිය මහින්ද අයියා වගේ, මට හිටිය මහින්ද අංකල් වගේ මේ ප්‍රශ්ණය දිහා බලනවා නම් තත්ත්වය මීට වඩා වෙනස්වෙන්න පුළුවන්.

මතු සම්බන්ධයි

MONT ALBERT DENTISTS P/L
For all Your Dental Requirements
We Provide
GENERAL DENTAL TREATMENT
COSMETIC DENTAL
TEETH WHITENING
PARTIAL/FULL DENTURES
EMERGENCY SERVICES
WE ACCEPT COMMUNITY DENTAL VOUCHERS, TEEN VOUCHERS, ALL PRIVATE HEALTH INSURANCES AND MEDICARE VOUCHERS FOR APPROVED PATIENTS.
FOR APPOINTMENTS
9890 3609
DISCOUNTS FOR FAMILIES, FREE CHECK UPS FOR KIDS UNDER 7 YEARS
DR. ENOKA JAYATILAKEBANDA (BDS)
MONT ALBERT DENTISTS
2A CHURCHILL ST
MONT ALBERT VIC 3127
(CLOSE TO BOX HILL CENTRAL)
www.montalbertdentists.com.au